සබරගමු අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Covid 19 - සති පාසල් වැඩ සටහන**

**චිත්‍ර විෂය**

**12 ශ්‍රේණිය තෙවන වාරය**

---

නිපුණතාව - 6.0 ආගමික හා සංස්කෘතික අංග, තෝරාගත් දෙස් විදෙස් කලා ශිල්පීන්ගේ කලා කෘති, අද්‍යතන දෘශ්‍ය කලා කෘති හා ජනමාධ්‍ය ඇසුරින් හඳුනාගත් කලා නිර්මාණ විචාරශීලීව රසාස්වාදයට ලක් කරමින් ස්වතන්ත්‍ර නිර්මාණ සඳහා භාවිතයට ගනියි.

නිපුණතා මට්ටම - 6.5 යුරෝපීය උපස්ථිතිවාදී සහ පශ්චාත් උපස්ථිතිවාදී කලාකරුවන්ගේ නිර්මාණ අධ්‍යයනය කරයි.

පාඩම - උපස්ථිතිවාදී ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යනය කරමු. (ක්ලෝඩ් මොනේ)

කාලච්ඡේද - 01

---

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

1. උපස්ථිතිවාදය ආරම්භ වූයේ කුමන සියවසේද?

(1) 20 වන සියවසේ දී (2) 17 වන සියවසේ දී (3) 19 වන සියවසේ දී
(4) 18 වන සියවසේ දී (5) 16 වන සියවසේ දී

2. උපස්ථිතිවාදීන් විසින් බැහැරකරන ලද්දේ,

(1) වස්තු ආලෝකයට දක්වන ප්‍රතික්‍රියා අධ්‍යනය
(2) සම්මත ශාස්ත්‍රාලීය පර්යාලෝකය
(3) බහුවර්ණයෙන් යුක්ත සෙවනැලි දැක්වීම
(4) දෛනික ජීවිතයේ වස්තුවිෂය තෝරා ගැනීම
(5) ස්වභාවික ආලෝකය හා ස්වභාවික ලෝකය

3. හිරු උදාවක උපස්ථිතිය නම් චිත්‍රය තුල ප්‍රධාන නාභීය කේන්ද්‍රය වන්නේ,

(1) සූර්යයා යි (2) බෝට්ටු පේලිය යි (3) ජලතලය යි
(4) ඈත අහස යි (5) සිතිජය යි

4. වෝටර් ලිලි සහ ජපන් පාලම චිත්‍රයේ වඩාත් අවධාරණය කර ඇත්තේ,

(1) නිල් පැහැය සහ රතු පැහැයයි
(2) නිල් පැහැයයි
(3) උෂ්ණ වර්ණවල ප්‍රභේදයන් ය
(4) කොළ පැහැය සහ එහි ප්‍රභේදයන් ය
(5) කොළ පැහැයයි

5. සෙවණැල්ලට වර්ණ ගණනාවක් ඇතැයි යන ප්‍රකට උපස්ථිතිවාදී මතවාදය තහවුරු කෙරෙන ක්ලෝඩ් මොනේගේ නිර්මාණය වන්නේ,

(1) වෝටර් ලිලී සහ ජපන් පාලම යි
(2) හිරු උදාවක උපස්ථිතිය යි
(3) වෝටර් ලූ පාලම යි
(4) තිරිඟු යාය යි
(5) රොවුන් දේවස්ථානය යි

- පහත අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

6. ii. උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න.

ii. උපස්ථිතිවාදී කලා ව්‍යාපාරය බිහි වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න.

iii. උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයේ පුරෝගාමී සිත්තරෙකු වූ ක්ලෝඩ් මොනේගේ සිතුවම් පිළිබඳ ඇගයීමක් කරන්න.

සැකසුම - එල්. එච්. වයි. ප්‍රබුද්ධිකා , ර/සීවලී මධ්‍ය විද්‍යාලය.